# ගුරු දිවිය සංවර්ධනයට මාර්ගගත අත්වැලක්

e-Learning by TEA
Teacher Education Administration Branch

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

## වැඩසටහනේ අරමුණ

තම අභිමතය පරිදි ස්වයං ගුරු වෘත්තීය සංවර්ධනයේ නිරතවීම සඳහා ගුරු භවතුන් යොමු කිරීම

# වැඩසටහනේ අන්තර්ගතය:

පාසල් පාදක වෘත්තීය සංවර්ධනයට අදාලව තේමා 10ක් යටතේ ගුරුවරයාගේ ස්වයං අධ්‍යයනය සඳහා ස්වයං අධ්‍යයන කට්ටල 10ක් පහත දැක්වෙන මාතෘකා පාදක කරගෙන සකස් කර ඇත.

1. ක්‍රියාකාරී ඇගයුම (Active learning)
2. දෙවෙනි භාෂාව ඉගෙනුම (Second language learning)
3. පාසල හා ප්‍රජාව (School and community)
4. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමශිල්ප (Learning teaching methodologies)
5. කාර්ය මූලික පර්යේෂණ (Action research)
6. ළමයා හඳුනාගැනීම (Identify learner)
7. ප්‍රත්‍යාවේක්ෂණය (Reflection)
8. ගුරු උපාධ්‍යායනය (Mentoring)
9. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඊ-තාක්ෂණය භාවිතය (E-Technology for teaching learning process)
10. ගුරු වෘත්තීය සංවර්ධනය (Teacher professional development)

ඔබේ අභිමතය හා අවශ්‍යතාවය මත ඉහත මාතෘකාවක් තෝරාගෙන ස්වයං අධ්‍යයනයේ යෙදෙමින් ඔබගේ වෘත්තීය සංවර්ධනය කෙරෙහි යොමුවන්න. ඔබ තෝරාගත් මාතෘකාව මත click කිරීමෙන් අදාල ඉගෙනුම් ද්‍රව්‍ය වෙත ප්‍රවේශ විය හැකි ය.

පාසලේ දී හෝ නිවසේ දී හෝ ඔබට ලැබෙන නිදහස් කාල පරිච්ඡේදයක දී වුවද මෙම මොඩියුල අධ්‍යයනය කරන්න. මොඩියුල අධ්‍යයනයේ දී ඔබ විසින් සිදු කරන ලද ඉගෙනුම ඔබ විසින්ම ඇගයීම සඳහා සැකසූ ප්‍රශ්නාවලියක් ද සෑම මොඩියුලයකම අවසානයේ ඇතුලත් කර ඇත.පියවරෙන් පියවර මොඩියුලය අධ්‍යයනය කිරීමේ දී අඛණ්ඩව ස්වයං තක්සේරුවක යෙදෙමින් අවසාන ඇගයීම කරා ඔබ යොමුවනු ඇත.

ඔබගේ වෘත්තීය සංවර්ධනය ඔබ විසින් ම ඇති කර ගත යුතුබව යන මූලික සිද්ධාන්තය පෙරදැරිකොට ගෙන නිර්මාණය කර ඇති මෙම මොඩියුල අධ්‍යයනයෙන් ඔබේම වෘත්තීය සංවර්ධනයක් සිදුවන අතර සහතිකයක් ලබා ගැනීම වැනි වෙනත් අභිමතාර්ථයක් මෙම අධ්‍යයන ක්‍රියාවලියේ ඇතුලත් නොවේ.

මෙම මොඩියුල අධ්‍යයනය සම්පූර්ණ කිරීම සඳහා පොදු උපදෙස්:

- ඔබට අවශ්‍ය මොඩියුලය ප්‍රමුඛතාවය අනුව තෝරා ගන්න.
- නිදහස්ව අධ්‍යයනයේ යෙදෙන්න.
- විෂයය අන්තර්ගතය අධ්‍යයනයෙන් ඉගෙනුමක් ලැබුවේද යන්න ඔබම තක්සේරු කරන්න.
- ඇගයීම කරන්න.
- ඔබගේ ඉගෙනුම පිළිබඳව ඔබ සතුටු නොවන්නේ නම්, මොඩියුල අන්තර්ගතය නැවත අධ්‍යයනය කරන්න.

මෙම ක්‍රියාවලිය ඔබගේ වෘත්තීය කාර්යයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇත.

එක් එක් මොඩියුලයේ අන්තර්ගතය පහත දැක්වෙන ආකාරයෙන් සාරාංශ ගත කර ඇත.

1. ක්‍රියාකාරී ඇගයුම (Active learning)

මෙම මොඩියුලය හැදෑරීමෙන් ඔබට විවිධ ආකාරයේ නිර්මාණශීලී ඉගෙනුම් ක්‍රමවේද භාවිත කරමින් ශිෂ්‍යයින්ට ක්‍රියාකාරී ඉගෙනුමකට අවස්ථාව ලබා දීමත් සෘජු අත්දැකීම් මගින් ලබන ඉගෙනුම ජීවිතයට ගළපා ගැනීමටත් හැකිවන ආකාරයට පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩා ඵලදායි කර ගැනීමට අවස්ථාව ලැබේ.

2. දෙවෙනි භාෂාව ඉගෙනුම (Second language learning)

21වන සියවසේ ගුරුවරයා මනා භාෂා කුසලතාවකින් යුක්ත විය යුතුය. ශ්‍රී ලංකාවේ සිංහල හා දෙමළ භාෂා රාජ්‍ය භාෂා ලෙස භාවිත වේ. ඒ සඳහා තම මව්බස පමණක් නොව භාෂා කිහිපයක් ම දැන සිටීම වෘත්තීය නිපුණතාවය සඳහා අත්‍යාවශ්‍ය වේ. සිංහල කතා කරන ජනයාට දෙවන භාෂාව ලෙස දෙමළත් දෙමළ කතා කරන ජනයාට දෙවන භාෂාව ලෙස සිංහලත් ඉගෙනීම අවශ්‍ය වේ. සම්බන්ධීකරණ භාෂාව ලෙස ඉංග්‍රීසි දැන ගැනීමත් අවශ්‍ය වේ. ඒ සඳහා මග පෙන්වීමක් ලෙසට මෙම මොඩියුලය ඔබ වෙත ඉදිරිපත් වේ.

3. පාසල හා ප්‍රජාව (School and community)

මෙම මොඩියුලය හැදෑරීම මගින් පාසල යනු ස්ථර පමණක් ගනුදෙනු කරන ආයතනයකින් ඔබ්බට ගොස් තමා සතු ප්‍රමුඛතම මානව සම්පත වන ශිෂ්‍යයින් පාසල වෙත එවනු ලබන ප්‍රජාවත් වැදගත් මානව සම්පතක් ලෙස හඳුනා ගැනීමට හැකි වනු ඇත. එසේම ප්‍රජාවෙන් පාසලට හා පාසලෙන් ප්‍රජාවට යන සංකල්පය දෙස නවමු ඇසකින් දකිමින් යහපත් පාසල්-ප්‍රජා සහ සම්බන්ධතාවයක් ගොඩනැගීමට දායකත්වය සපයන සමාජයේ පෙරගමන්කරුවෙකු ලෙස ගුරුවරයා සතු වැදගත් කාර්යභාරය වටහා ගැනීමට අවස්ථාව ලැබේ.

4. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමශිල්ප (Learning teaching methodologies)

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමශිල්ප, ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලිය සුසාධ්‍ය කිරීම පිණිස ගුරුවරයාට භාවිත කල හැකි උපාය මාර්ගයකි. මෙම උපාය මාර්ග ගුරු ප්‍රමුඛ ශිල්පීය ක්‍රම හා ශිෂ්‍ය ප්‍රමුඛ ශිල්පීය ක්‍රම ලෙසට වර්ග දෙකකට බෙදිය හැකි වන අතර ශිෂ්‍ය ප්‍රමුඛ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමශිල්ප තුනක් වන ගැටලු කේන්ද්‍රීය ඉගෙනුම, ව්‍යාපෘති පාදක ඉගෙනුම සහ නාට්‍ය ක්‍රමවේද යන ව්‍යවහාරයන් මොඩියුලයෙහි අන්තර්ගත වේ.

5. කාර්ය මූලික පර්යේෂණ (Action research)

ගුරුවරයෙක් සංවර්ධනය කර ගත යුතු සුවිශේෂී නිපුනතාවයක් ලෙස අධ්‍යාපනඥයින් විසින් කාර්යමූල පර්යේෂණ කුසලතාව දක්වා තිබේ. ළමයින් පිළිබඳව විමර්ශනාත්මක දෘෂ්ටි කෝණයකින් යුතුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරතවීම සඳහා ගුරුවරයෙක් සතුවිය යුතු “පර්යේෂණ ඇස” පිළිබඳ මෙම මොඩියුලයෙන් විස්තර වේ. නිරතුරුව කිමදැයි යන ප්‍රශ්නය තුලින් ළමයින් දෙස බලමින් ළමයින්ගේ ගැටලු හඳුනාගෙන එම ගැටලුවලට විසඳුම් සොයමින්, තම කාර්යය ළමයාගේ අපේක්ෂිත වෙනස ඇතිවන තුරු මැදිහත්වීමේ ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳව කුසලතා සංවර්ධනය කරගැනීමට මෙම මොඩියුලය අධ්‍යයනයෙන් ගුරුවරයාට හැකිවනු ඇත.

6. ළමයා හඳුනාගැනීම (Identify learner)

“ජෝන්ට ලතින් ඉගැන්වීමට පෙර ගුරුවරයා ජෝන් හඳුනා ගත යුතු ය.” යන ප්‍රකාශය පාදක කර ගනිමින් ඉගෙනුම් අත්දැකීම් ළමයාට ලබා දීමට පෙර ළමයා මැනවින් හඳුනාගැනීම ඉතා වැදගත් වේ. ඒ සඳහා ගුරුවරයාට මගපෙන්වීමක් ලබා දීම අරමුණු කර ගනිමින් මෙම මොඩියුලය සකස් කර ඇත. ළමයා හඳුනාගැනීමේ වැදගත්කම, ළමයා හඳුනාගැනීමේ විධිමත් සහ අවිධිමත් ක්‍රම විස්තර කරමින් මෙම

මොඩියුලයේ විෂයය අන්තර්ගතය නිර්මාණය වී ඇත. ළමයා හඳුනාගෙන ළමයාට ගැලපෙල ලෙස ඉගෙනුම් අත්දැකීම් ළමයා වෙත යොමු කරන ගුරුවරයා ඵලදායි ගුරු කාර්යයක නිරතවන්නෙක් මෙන්ම ලමයින් ප්‍රීතිමත් ඉගෙනුමකට යොමු කරන ඵලදායි ගුරුවරයෙක් වන ආකාරය මෙම මොඩියුලය අධ්‍යයනයෙන් ඔබට පැහැදිලි වේ.

7. ප්‍රත්‍යවේක්ෂණය (Reflection)

තමා යොමුවන කාර්ය පිළිබඳව සතිමත් භාවයෙන් කටයුතු කිරීම හා  නැවත නැවත ආවර්ජනය කරමින් ප්‍රබලතා හා දුබලතා හඳුනාගෙන තම ක්‍රියාව පියවරෙන් පියවර සංවර්ධනය කර ගැනීමේ සමස්ත ක්‍රියාවලිය ප්‍රත්‍යවේක්ෂණය නමින් හැඳින්වේ. කාර්යය කිරීමට පෙර, කාර්යය කිරීමේ දී හා කාර්යය කිරීමෙන් පසුව ප්‍රත්‍යවේක්ෂණයට යොමුවීමෙන් ගුරුවරයාට තම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ඵලදායක බව ගුණාත්මකභාවය සංවර්ධනය කර ගත හැකි ආකාරය ස්වයං වෘත්තීය සංවර්ධන උපාය මාර්ගයක් ලෙස භාවිත කල හැකි ආකාරය පිළිබඳව කුසලතාවය මෙම මොඩියුලය අධ්‍යයනය කිරීමෙන් සංවර්ධනය කර ගත හැකි වේ.

8. ගුරු උපාධ්‍යායනය (Mentoring)

පාසලේ සිටින අත්දැකීම් සහ පලපුරුද්දෙන් සන්නද්ධ ගුරුවරුන්ගෙන් ලැබෙන අධ්‍යයන සේවාව උපධ්‍යායන සේවාව ලෙස හැඳින්වේ. විශේෂයෙන්ම නවක ගුරු මහත්ම මහත්මීන්ට පාසලේ සිටින වෘත්තීය කුසලතාවලින් පිරිපුන් ජ්‍යෙෂ්ට ගුරුවරුන්ගෙන් තම වෘත්තියට අදාලව මගපෙන්වීම් ලබාගත හැකි එම සේවාව පිළිබඳව මෙම මොඩියුලය අධ්‍යයනයෙන් ඔබට අවබෝධය ලබා ගත හැකි ය. තම පාසලේ සිටින වටිනා සම්පතක් ලෙස අත්දැකීම් වලින් පරිපූර්ණ ගුරුවරුන් ඔබට හඳුනා ගැනීමට හැකිවනු ඇත. ස්වයං වෘත්තීය සංවර්ධනයේ උපාය මාර්ගයක් ලෙස ගුරු උපධ්‍යායනය හේතු වේ. සේවාවේ වැදගත්කම මෙම මොඩියුලය හැදෑරීම මගින් ඔබට ප්‍රත්‍යක්ෂ වනු ඇත.

9. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතය (Information Technology for teaching learning process)

විසි එක්වන සියවසට ගැළපෙන විශ්විය දරුවකු නිර්මාණය කිරීම උදෙසා නූතන පාසල් ගුරුවරයා සතු තාක්ෂණික දැනුම කුසලතාව යාවත්කාලීන විය යුතුවේ. ඒ සඳහා නව තාක්ෂණික ඉගෙනුම් ප්‍රවණතා සොයා යාමේ හැකියාව සහිත ශිෂ්‍යයෙකු නිර්මාණය කිරීමට  හැකිවන ලෙස ගුරුවරයාගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව වැඩි දියුණුවීම මෙම මොඩියුලය අධ්‍යයනයෙන්  සිදුවේ.

10. ගුරු වෘත්තීය සංවර්ධනය (Teacher professional development)

ගුරුවරයාට 21 වන සියවසට ගැලපෙන සුහුරු පුරවැසියා, තම පන්ති කාමරයෙන් බිහිකිරීමේ අභියෝගය ජය ගැනීම සඳහා ගුරු වෘත්තීය සංවර්ධන අවස්ථා මහඟු රුකුලක් සපයනු ඇත.ගුරු වෘත්තීය සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ විස්තර කෙරෙන මෙම මොඩියුලය හැදෑරීමෙන් ගුරු වෘත්තීය සංවර්ධනය පිළිබඳ ව සමස්ත දැක්මක් ඔබට ලබා ගැනීමට හැකි වනු ඇත.